| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2021.04.09 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2021/06 ට පලමු එකතුව**

සියළුම සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති කළමණාකරුවන් ,

<u>අපේ කම රැක ගනිමු - ඉතුරුමට මඟ කියමු</u>

<u>සිංහල /හින්දු අලුත් අවුරුදු ගණුදෙණු චාරිත්‍රයට සමගාමී ව සමෘද්ධි බැංකු වල ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන - 2021</u>

01. මීට පෙර වසර වලදී සමෘද්ධි බැංකු විසින් අලුත් අවුරුදු උත්සව පැවැත්වීම අප වැඩසටහනේ ප්‍රධාන අංගයක් වී තිබුණි.2021 වර්ෂයේ ද සිංහල /හින්දු අලුත් අවුරුදු ගණුදෙණු චාරිත්‍රයට සමගාමී ව සමෘද්ධි බැංකු වල ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීමට අදාළ ව සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2021/06 මඟින් උපදෙස් ලබා දී ඇත.

02. සිංහල /හින්දු අලුත් අවුරුදු උත්සවය අලලා සමෘද්ධි බැංකු මූලික කරගෙන මෙවරත් බක්මහ අලුත් අවුරුදු උත්සව පැවැත්වීමට ඉඩ දෙන ලෙස ඉල්ලීම් රැසක් ලැබී ඇත.

03. ඒ අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් තම බල ප්‍රදේශයේ තෝරා ගත් ප්‍රජාමූල සංවිධානයක මූලිකත්වයෙන් අලුත් අවුරුදු උත්සවයක් 2021.04.25 ඉරු දින පැවැත්වීමට කටයුතු කල හැකිය.

04. මෙම උත්සවය තුල ජන ක්‍රීඩා සහ එම ප්‍රදේශයන්ට ආවේනික වූ ක්‍රීඩා අංග වලින් සමන්විත අවුරුදු උත්සවය සංවිධානය කල යුතුය.එනමුත් ගම හරහා දිවීම, කඹ ඇදීම, කොට්ට පොර, ග්‍රීස් ගහ (මිනිරන් ගහ) සහ සෞඛ්‍ය අංශ නොපවත්වන ලෙස දන්වන ක්‍රීඩා අංග සංවිධානය නොකල යුතුය.

05. බක්මහ අලුත් අවුරුදු උත්සවයේ කටයුතු වෙනුවෙන් ප්‍රජාමූල සංවිධානයට උපරිම රු.40,000 ක මුදලක් ලබා දිය යුතු අතර, එම මුදලින් රු.30,000 ක් බැංකු අරමුදලින් ද රු.10,000 ක් ප්‍රජාමූල බැංකු අංශයෙන් ප්‍රතිපූර්ණය කරන අතර එතෙක් පහත පරිදි ගිණුම් සටහන් තබා මුදල් නිදහස් කල යුතුය.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

හර - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතු අරමුදල් ගිණුම (කේත අංකය - 3309)
හර - වැය ගිණුම - උත්සව කටයුතු (කේත අංකය - 2133)
බැර - සමාජික නොවන තැන්පත් ගිණුම

ඉන් අනතුරුව, ප්‍රජාමූල සංවිධානය නමින් ඇති තැන්පත් ගිණුමේ සටහන් කර තැන්පතු මුදලක් ලෙස නිදහස් කල යුතුය.
ඉදිරි දිනක ප්‍රජාමූල බැංකු අංශය විසින් රුපියල් 10,000/- ක අරමුදල් ලබා දෙන අතර එහිදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතු අරමුදල් ගිණුමට බැර සටහනක් තබා අරමුදල පියවා දැමිය යුතු ය.

06. සමෘද්ධි බැංකුව විසින් දිස්ත්‍රික් සමෘද්ධි අංශයට පහත තොරතුරු 2021.05.04 ට පෙර ලබාදිය යුතු අතර දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් සියළු තොරතුරු රැස් කර 2021.05.18 ට පෙර bank@samurdhi.gov.lk විද්‍යුත් ලිපිනය හරහා ප්‍රතිපූර්ණ මුදල් ප්‍රජාමූල බැංකු අංශයෙන් ඉල්ලා සිටිය යුතුය.

| සමෘද්ධි බැංකුවේ නම | උත්සවය පැවැත්වූ ප්‍රජාමූල සංවිධානයේ නම | ප්‍රජාමූල සංවිධානයට ලබා දුන් මුදල(රු.) | ප්‍රතිපූර්ණය ඉල්ලා සිටින මුදල(රු.) |
|---|---|---|---|
| | | | |
| | | | |
| එකතුව | | | |

07. උත්සව කටයුතු සංවිධානය, ප්‍රජාමූල සංවිධානයේ නිලධාරීන්ට සිදු කර ගැනීමට මඟ පෙන්වීම සහ අධීක්ෂණය බැංකු පාලක මණ්ඩලය,බැංකු කලමනාකරු සහ වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා විසින් කල යුතුය.අනෙකුත් කාර්යය මණ්ඩලය ද සහය දක්වන ලෙස දන්වමි.මෙහිදී අරමුදල් වියදම් කල ආකාරය පිළිබඳ සොයා බලා, ලබා දුන් මුදලෙහි ඉතිරියක් ඇති විටක නැවත බැංකුවට ලබා ගත යුතුය.

08. මෙම කාර්යය සඳහා බාහිර සංවිධාන/පාර්ශව ඇතුළු සාමාජිකයන්ගේ පරිත්‍යාග සහ සහය ලබා ගැනීමට හැකි අතර, එම තොරතුරු සුරක්ෂිතව ගොනු කර තැබීමට උපදෙස් ලබා දිය යුතුය.

09. අවුරුදු උත්සව කටයුතු පැවැත්වීමේදී සෞඛ්‍ය අංශ සහ ශ්‍රී ලංකා පොලිසියේ උපදෙස් වලට අනුකූල වන ලෙසත් අදාල අංශ සම්බන්ධීකරණය බැංකු පාලක මණ්ඩලය,බැංකු කලමනාකරු,බැංකු සමිති කලමනාකරු ඇතුළු කාර්යය මණ්ඩලය විසින් සිදු කර දෙන ලෙස තවදුරටත් දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. අධ්‍යක්ෂ (ප්‍රජාමූල සංවිධාන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
6. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
7. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
8. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.